# AN INVESTIGATION INTO THE IMPLEMENTATION OF THE MODERN UNIVERSITY CONCEPT IN THE BUDDHIST SANGHARAMAS CONCERNING THE ACADEMIC DEVELOPMENT OF THE ANURADHAPURA PERIOD

A.S. Siriwardena[1] and N.G.I.M. Wickramasinghe[2]


## Abstract

The historical exploration of educational institutions in the Anuradhapura era presents a remarkable parallel to the modern university system. While the concept of the university emerged in the Western world during the 9th to 12th centuries AD, ancient South Asia was home to institutions of learning that closely resembled this model. Notably, Nalanda, Jagaddala, and Taxila in India, Mahavihara, Abhayagiriya, and Jethavanarama in Sri Lanka, stand as exemplars of a rich educational tradition. This comparative study aims to identify the educational system prevalent in the ancient Anuradhapura era, specifically within the Mahavihara, Abhayagiriya, and Jethavanarama, by examining historical sources, including the Mahavamsya, Vansatthappakasiniya, Nikaya Sangraha, Fa-Hsien records, inscriptions, archaeological remnains of Anuradhapura city, and previous research reports. Mahavihara, as a stronghold of Theravada Buddhism, represented one fact of this system, while Abhayagiriya and Jethavanarama embraced a syncretic approach, drawing from both Theravada and Mahayana traditions. These ancient learning centres encompassed a broad spectrum of curricula, covering areas such as languages, religion, sciences, mathematics, and the arts. Recognitions and degrees were awarded to scholars, as demonstrated by names like Vagishwara, Kavichakravarti, Kaviraja, Vidyapati, and Kavikala Sarvajna, among others. The educational infrastructure was comprehensive, with provisions for laboratories, libraries, hospitals, Janthaghara (hostels for lay students), and almshouses. These sangharamas were more than just centers of religious learning; they were integrated institutions of holistic education. Moreover, they displayed an outward-facing orientation, engaging in international exchanges similar to their Indian counterparts, Nalanda, Valabhi, Taxila, and others, which held affiliations with countries like China and Java. In summary, this research explicitly confirms the existence of a cultured, university-level educational system in ancient Anuradhapura, anchored in the heritage of the Buddhist Sangharama's. This historical perspective on education enriches our understanding of this era's intellectual, cultural, and scholarly dimensions.


**Keywords:** Ancient Education, Anuradhapura era, University, Sangharama

[1] Librarian, Rajarata University of Sri Lanka

Email: librarian@rjt.ac.lk https://orcid.org/0000-0002-5342-5817

[2] Lecturer, Department of Humanities, Rajarata University of Sri Lanka

Email: ireshawickramasinghe123@gmail.com https://orcid.org/0009-0003-1151-5827

Received: 24 April 2023, Accepted revised version: 02 July 2023

This work is licensed under a Creative Commons Attribution-Share Alike 4.0 International License.

# අනුරාධපුර අවධියේ ශාස්ත්‍රෝන්නතිය හා සම්බන්ධ බෞද්ධ සංඝාරාම තුළ නූතන විශ්වවිද්‍යාල සංකල්පය ක්‍රියාත්මක වූයේ ද? (ඓතිහාසික සංසන්දනාත්මක අධ්‍යයනයක්)


## සාරසංක්ෂේපය

උසස් උපාධි පාඨමාලාවන් සහ පර්යේෂණ කාර්යයන් හී නිරත වූ විද්‍යාර්ථීන් සඳහා නිර්මාණය වූ 'විශ්වවිද්‍යාල' ලොව පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයන් වේ. විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළින් නව අදහස් සහිත නව හැඩයක මිනිසුන් බිහි කරයි. ඒ ඒ විෂය ක්ෂේත්‍රයන්හී පවත්නා සත්‍යතාවන් පසුපස කුතුහලයෙන් යුතුව හඹා යන්නන් පිරිසක් නිර්මාණය කරයි. එහෙයින් ම විශ්වවිද්‍යාලය මනා පරිපාලනයකින් යුතු, පීඨ වශයෙන් වෙන්ව පවතින ආයතනයකි. නූතන බටහිර ලෝකයට විශ්වවිද්‍යාල සංකල්පය හඳුන්වාදෙනු ලැබෙනුයේ ක්‍රි.ව. 9-12 සියවස් කාලයෙහි බිහිවන බොලොඤ්ඤා, පැරිස්, ඔක්ස්ෆර්ඩ් ආදී උසස් අධ්‍යාපන ආයතනයන් ය. නමුත් ආසියාතික බෞද්ධාගමික සමාජය තුළ එකී නූතන විශ්වවිද්‍යාල සංකල්පයට සමාන අධ්‍යාපන ආයතන ගණනාවක් බිහිව පැවතුනි. ඉන්දියාවේ නාලන්දා, ජගද්දලා, තක්ෂිලා වලභි මෙන්ම ශ්‍රී ලංකාවේ මහාවිහාරය, අභයගිරිය සහ ජේතවනාරාමය ඊට නිදසුන් වේ. පුරාතන අනුරාධපුරයේ මහාවිහාරය, අභයගිරිය සහ ජේතවනාරාමය යන අධ්‍යාපන ආයතන තුළින් විශ්වවිද්‍යාල සංකල්පය පිළිබිඹු වන්නේ ද යන පර්යේෂණ ගැටළුව ඔස්සේ සිදු කෙරෙන මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ එකී ආයතනයන්හී පැවති අධ්‍යාපන ක්‍රමවේදය හඳුනාගැනීමත්, ඒවායෙහි විෂය මාලාවන්, අධ්‍යයන පහසුකම්, විද්‍යාර්ථීන් සහ ආචාර්යවරුන්, පරිපාලකයින්, රාජානුග්‍රහයන් ආදිය අධ්‍යයනය කිරීමත් ය. මේ සඳහා මහාවංශය, වංසත්ථප්පකාසිනිය, නිකාය සංග්‍රහය, පාහියං වාර්තා ආදී පුරාතන සාහිත්‍ය, සෙල්ලිපි, අනුරාධපුර තදාශ්‍රිතයේ නශ්ටාවශේෂ සහ පූර්ව පර්යේෂණ වාර්තා අධ්‍යයනයට බඳුන් කරයි. මහින්දාගමනයෙන් ආරම්භ වන බෞද්ධ ආරාම අතරින් මහාවිහාරය ථෙරවාදී අධ්‍යාපනය නියෝජනය කළ අතර අභයගිරිය හා ජේතවනය ථෙරවාදයත් මහායානයත් යන සංකල්ප ද්විත්වයම පිළිගෙන තිබේ. අෂ්ටමූලායතන වශයෙන් බෙදා භාෂාවන්, ආගම, විද්‍යා, ගණිත, කලා ශිල්පයන් විෂයමාලා සකස්කර සුත, ධත, වාච්‍ය පාරමිතා, වාසානුපෙක්ඛනා, දිට්ඨායාසුප්පටිවිද්‍යා යන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදයන් අනුව සකස්කර ඇත. පාහියං හිමි, බුද්ධඝෝෂ හිමි වැනි විදේශීය භික්ෂූණ් ද මේවායෙහි අධ්‍යාපනය හදාරා වාගීශ්වර, කවිචක්‍රවර්ති, කවිරාජ, විද්‍යාපති, කවි කාල සර්වඥ ආදී උපාධීන් ලබා තිබේ. විද්‍යාගාර, පුස්තකාල, රෝහල් පහසුකම්, ජන්ථාඝර, දානශාලා සහ නේවාසිකාගාර වැනි අධ්‍යාපනික සහ සනීපාරක්ෂක පහසුකම් ද මෙමගින් සළසා තිබේ. නාලන්දා, වලභි, තක්ෂිලා ආදී ඉන්දීය විශ්වවිද්‍යාල, චීනය, ජාවා ආදී රාජ්‍යන් සමගත් ජාත්‍යන්තර සබඳතා වර්ධනය කරගෙන තිබේ. මෙලෙසින් විමසා බැලීමේ දී මෙකී සංඝාරාමයන් කේන්ද්‍ර කරගනිමින් විශ්වවිද්‍යාල මට්ටමේ අධ්‍යාපන ක්‍රමවේදයක් ක්‍රියාත්මක වී ඇති බව තහවුරු කළ හැකිය.


**ප්‍රමුඛ පද :**පැරණි අධ්‍යාපනය, අනුරාධපුර යුගය, විශ්වවිද්‍යාල, සංඝාරාම

## හැඳින්වීම

පෘථිවි ගෝලයේ පොදු සත්ත්ව කාණ්ඩයකට අයත් වූ මානවයා සෙසු සත්ත්වයින් අතික්‍රමණය කරමින් භාෂාවක් හැසිරවීමටත්, කලාත්මක, විද්‍යාත්මක සහ තාක්ෂණික සුහුරුතාවක් ළඟා කරගැනීමටත් සමත් වූයේ ඔහු විසින් ක්‍රම ක්‍රමයෙන් අත්දැකීමෙන් උකහා ගත් දැනුම පදනම් කරගනිමිනි. එසේ රැස්කරගත් දැනුම් පද්ධතිය පරම්පරාවෙන් පරම්පරාවට ප්‍රදානය කිරීම ඔස්සේ වත්මන් තාක්ෂණික ලෝකය සියතින් හැසිරවීමට මිනිසාට හැකියාව ලැබී ඇත. දැනුම සම්ප්‍රේෂණය වූ කලී මානව ඉතිහාසයේ වැදගත්ම වූ ක්‍රියාවලියක් බව මෙයින් හඳුනාගත හැකි ය. 'අධ්‍යාපනය' වූ කලී එසේ දැනුම සම්ප්‍රේෂණය කිරීමේ ප්‍රධානතම මාර්ගය යි.

ශ්‍රී ලාංකේයන්ගේ විධිමත් අධ්‍යාපනික ඉතිහාසය ක්‍රි.පූ.තෙවැනි සියවසේ මහින්දාගමනයෙන් අනතුරුව සිදු වූ බෞද්ධාගමික ප්‍රබෝධයත් සමඟ අත්‍යන්තයෙන්ම බැඳී පවත්නකි. අනුරාධපුර අවධියේ පටන්ම මෙරට අධ්‍යාපනය හැසිරවීමේ ප්‍රමුඛ බලවේගය බවට පත් වූයේ විහාරස්ථානයන් ය. දීඝනිකායට අනුව ගිහි පැවිදි දෙපාර්ශවය වෙතම අධ්‍යාපනය ලබා දිමේ වගකීම ආරාමික භික්ෂු සංඝයා වෙත පැවරී තිබුණු අතර රජුගේ පටන් සාමාන්‍ය ගැමියා දක්වාම අධ්‍යාපනය ලබාගෙන ඇත්තේ භික්ෂූණ් වහන්සේ ඇසුරෙනි. (දීඝනිකාය-3, 2014) මහින්දාගමනයෙන් පසු බිහි වු ප්‍රථම ආරාමික අධ්‍යාපන මධ්‍යස්ථානය වූයේ අනුරාධපුරයේ මහාවිහාරය යි. ඉන් අනතුරුව සෑගිරිය, මිරිසවැටිය, අභයගිරිය, ජේතවනාරාමය ආදී අධ්‍යාපන මධ්‍යස්ථාන අනුරාධපුරය කේන්ද්‍රීයව බිහි වූ අතර එම මධ්‍යස්ථානයන්හී ශාඛා රට පුරාම ව්‍යාප්තව පැවතුනි.

## පර්යේෂණ රික්තකය සහ ගැටළුව

ශ්‍රී ලාංකේය අධ්‍යාපනයේ ඓතිහාසික පසුබිම සහ අනුරාධපුරයේ පිහිටි සංඝාරාම ආශ්‍රිත අධ්‍යාපනය පිළිබඳ පර්යේෂණයන් බොහෝ ප්‍රමාණයක් සිදු වී තිබේ. වික්‍රමනායක අබේසිංහ, මහාචාර්ය මාලනී ඇඳගම,

ආර්.එච්.අයි.එස්.රණසිංහ සහ ටී.ජී. කුලතුංග ආදී වූ පර්යේෂකයින් ගණනාවකගේ අවධානය බෞද්ධාගමික ආරාමික අධ්‍යාපනය කෙරෙහි යොමු වී තිබේ. හුදෙකලාව හෝ පොදුවේ එම අධ්‍යාපන මධ්‍යස්ථානයන්හී ඓතිහාසික පසුබිම, අධ්‍යාපනික සේවාව, බිහි වූ විද්‍යාර්ථීන් සහ ග්‍රන්ථ ආදිය පිළිබඳව මෙම පර්යේෂකයින් විසින් ගුණාත්මක පර්යේෂණ ගණනාවක් සිදුකර තිබේ. ඔවුන්ගේ පර්යේෂණයන් සහ ප්‍රාථමික මූලාශ්‍රය අධ්‍යයනයේ දී හඳුනාගත් පර්යේෂණ හිඩැසක් වශයෙන් හඳුනාගත හැකි වූයේ පුරාතන අධ්‍යාපන රටාව සහ නූතන විශ්වවිද්‍යාලයීය අධ්‍යාපන රටාව අතර ඇති පොදු ලක්ෂණ හඳුනාගැන්මට උත්සාහ නොගැනීමයි. ඒ අනුව අනුරාධපුර අවධියේ සංඝාරාම අධ්‍යාපනය තුළ නූතනයේ ක්‍රියාත්මක වන විශ්වවිද්‍යාල සංකල්පයන් පැවතියේ ද? යන පර්යේෂණ ගැටළුව ඔස්සේ මෙම අධ්‍යයනය සිදුකරනු ලබයි.

**අරමුණ**

අනුරාධපුර අවධියේ සංඝාරාම අධ්‍යාපනය තුළ ක්‍රියාත්මක වූ නූතන විශ්වවිද්‍යාලයීය ලක්ෂණ හඳුනාගැනීම මෙම පර්යේෂණයේ මුඛ්‍ය පරමාර්ථය යි. ඊට අමතරව එම අධ්‍යාපන මධ්‍යස්ථානයන්හි ඉගැන්වූ විෂයන්, ආචාර්යවරුන් සහ ශිෂ්‍යයින්, ඒවායින් බිහි වූ ග්‍රන්ථ, අනු ශාඛාවන් මෙන්ම අධ්‍යාපන ආයතනයන්හී පරිපාලනය පිළිබඳව කරුණු හෙළිකර ගැනීම ද මෙහි මූලික අරමුණු අතර වේ. මෙම අධ්‍යාපන මධ්‍යස්ථාන නිර්මාණය වීමේ පසුබිම, ඒවායෙහි වූ භික්ෂු සංස්ථාව සහ මතවාදී දැක්ම, ජාත්‍යන්තර වශයෙන් පැවති සම්බන්ධතාවයන් ද අධ්‍යයනයට පාත්‍ර වේ.

**ක්‍රමවේදය**

අනුරාධපුර අවධියට අයත් අධ්‍යාපනික මධ්‍යස්ථානයන් වශයෙන් හඳුනාගත් මහාවිහාරය, අභයගිරිය සහ ජේතවනාරාමය ආශ්‍රිතව ක්ෂේත්‍ර අධ්‍යයනයක් සිදු කරන ලද අතර පුස්තකාල ගවේෂණය ඔස්සේ දීපවංශය, මහාවංශය, නිකාය සංග්‍රහය, වංසත්තප්පකාසිනිය සහ සද්ධර්මාලංකාරය ආදී වූ ප්‍රාථමික මූලාශ්‍ර ගණනාවක් අධ්‍යයනය කරන ලදි. සෙල්ලිපි මෙන්ම පාහියං, හියු-ත්-සාං ආදී විදේශිකයන්ගේ වාර්තාවන් ද වැදගත් විය. වල්පොල රාහුල හිමි, ඊ.ඩබ්. අදිකාරම්, වික්‍රමනායක අබේසිංහ, මහාචාර්ය මාලනී ඇඳගම, ආර්. එච්. අයි. එස්. රණසිංහ සහ ටී. ජී. කුලතුංග ආදී විද්වතුන්ගේ කෘති සහ පර්යේෂණ පත්‍රිකා වෙත ද අවධානය යොමු කර ඇත. නූතනයේ ක්‍රියාත්මක වන විශ්වවිද්‍යාල සංකල්පය හඳුනාගනුවස් ශබ්දකෝෂ සහ විශ්වකෝෂ භාවිත කළ අතර ශ්‍රී ලංකාවේ නූතනයේ ක්‍රියාත්මක වන රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය ද නිරීක්ෂණයට බඳුන් කෙරුණි. මෙසේ රැස්කරගත් සියළු දත්ත සංසන්දනාත්මක ක්‍රමවේදය සහ විස්තරාත්මක ක්‍රමවේදය භාවිත කරමින් නූතන විශ්වවිද්‍යාල සහ පුරාතන සංඝාරාම අධ්‍යාපනය අතර පවතින සංකල්පීය සබැඳියාව හඳුනාගැනීමට උත්සහ ගන්නා ලදි.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

උපතේ සිට මරණය දක්වාම ජීවන අත්දැකීම් ඔස්සේ අධ්‍යාපනය ලබන මිනිසා ජීවිතයේ මුල් අවධියේ දී කුමක් හෝ අධ්‍යාපන මධ්‍යස්ථානයකින් අධ්‍යාපනය ලැබීම නූතන ලෝකයේ පොදු ස්වභාවය යි. එහිලා 'විශ්වවිද්‍යාලය' සුවිශේෂී වන්නේ එය හුදු අධ්‍යාපන මධ්‍යස්ථානයක්ම නොවී දැනුම් උත්පාදන ක්‍රියාවලියක ද නිරතවන හෙයිනි. 'Universites' යනු විවිධ ක්ෂේත්‍රවලට උපාධි හා පශ්චාත් උපාධි අධ්‍යාපනය පිරිනමන උසස් අධ්‍යාපන හා පර්යේෂණ ආයතනයක් වශයෙන් ශබ්ධකෝෂයන්හී නිරුක්ති සපයයි. එය නිදහස යන අදහසින් ද යුක්ත ය. ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියෙන් ඔබ්බට ගොස් ස්වාධීන පර්යේෂණ සිදු කිරීමේ නිදහස සහ ඊට අවශ්‍ය පහසුකම් ද විශ්වවිද්‍යාල මගින් සළසා දෙයි. එහෙයින්ම විශ්වවිද්‍යාලයකින් අපේක්ෂා කරනුයේ අධ්‍යයනයේ නිදහසින් ඵල ලබාගන්නා ස්වාධීන මිනිසුන් බිහි කිරීමයි.

නූතන විශ්වවිද්‍යාල සංකල්පයේ ආරම්භය ලෙසින් බටහිර ලෝකයේ බොලොඤ්ඤා විශ්වවිද්‍යාලය (ක්‍රි.ව. 1088), පැරිස් (සෝබෝන්) විශ්වවිද්‍යාලය (ක්‍රි.ව. 1150), ඔක්ස්පර්ඩ් විශ්වවිද්‍යාලය (ක්‍රි.ව. 1167), කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය (ක්‍රි.ව. 1209) සහ පාදුවා විශ්වවිද්‍යාලය (ක්‍රි.ව. 1222) ආදී ආයතන හඳුනාගත හැකි ය. මෙරට විශ්වවිද්‍යාල අධ්‍යාපනය ආරම්භ වන්නේ ලංකා විශ්වවිද්‍යාලයෙනි. ක්‍රි.ව. 1942 දී ලංකා විශ්වවිද්‍යාලය ආරම්භ කෙරුණු අතර පසුකාලීනව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සහ කැලණිය විශ්වවිද්‍යාලය විද්‍යෝදය සහ විද්‍යාලංකාර පිරිවෙන් ආශ්‍රයෙන් නිර්මාණය වී තිබේ. ඊට සියවස් ගණනාවකට පෙර ඉන්දියාවේ තක්ෂිලා, නාලන්දා, වික්‍රමශීලා වැනි විද්‍යායතන බිහි වී පැවති අතර ශ්‍රී ලංකාවේ මහාවිහාරය, අභයගිරිය සහ ජේතවනාරාම විහාර මූලික කර ගනිමින් විද්‍යායතන බිහි වී පැවතුනි.

මහින්දාගමනයට පූර්වයෙන් මෙරට ක්‍රියාත්මක වූයේ බ්‍රාහ්මණ අධ්‍යාපන ගුරුකුලයන් ය. ඒ අනුව පණ්ඩුකාභය කුමරු අධ්‍යාපනය ලැබීම උදෙසා පණ්ඩුල බ්‍රාහ්මණයාගේ ශිල්පායතනය වෙත ගොස් ඇත. (මහාවංශය, 2007, පරි.10, ගාථා. 19-23) ක්‍රි.පූ. තෙවැනි සියවසේ දී මෙරටට පැමිණි මිහිඳු හිමියන් විසින් චුල්ලහත්ථිපදෝපම ආදී සූත්‍රයන්ගේ ආරම්භ කළ ධර්ම දේශනා ශෛලිය මෙරට බෞද්ධ අධ්‍යාපනයේ ආරම්භය සනිටුහන් කළ අතර

මහාවිහාරය ප්‍රථම බෞද්ධ අධ්‍යාපන මධ්‍යස්ථානය විය. මහාවිහාරයෙහි අධ්‍යාපනය ථූපාරාමය, මිරිසවැටිය, ඉස්සරසමණාරාමය, වෙස්සගිරිය සහ චේතියගිරිය යන පංචමහා ආවාසයන් හරහා තවදුරටත් ව්‍යාප්ත විය. (රණසිංහ, 2005) ථේරවාදය ගුරුකොටගත් මහාවිහාර අධ්‍යාපනයට අභියෝගයක් එල්ල වූයේ වළගම්බා රාජ්‍ය සමයේ දී අභයගිරිය නිර්මාණය වීමත් සමඟ ය. අභයගිරිවාසීන් විසින් ථේරවාදය පමණක් නොව මහායානික සංකල්පයන් සඳහා ද තම දොරටු විවෘතකොට තැබූ හ. මහසෙන් රාජ්‍ය සමයේ දී ඉදිවන ජේතවනාරාමය ද හුදෙක් ථේරවාදයෙන් ඔබ්බට ගොස් අභයගිරිවාසීන් අනුව යමින් විවිධ බෞද්ධ නිකායික ඉගැන්වීම් කෙරෙහි යොමු වී තිබේ. අනුරාධපුර අවධියේ අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයන් වූයේ මෙම විහාර ත්‍රිත්වය යි. නූතන විශ්වවිද්‍යාල සංකල්පය හා සමපාත වන ලක්ෂණ මෙම විහාරයන් සතුව පවතින්නේ ද යන පර්යේෂණ ගැටළුව වෙත යොමු වීමේ දී ප්‍රථමයෙන්ම මෙම විහාර ත්‍රිත්වයේ පැවති අධ්‍යාපනික ව්‍යුහය හඳුනාගත යුතු වේ.

මහාවිහාරයේ සීමා සළකුණු කිරීමෙන් අනතුරුව 'මෙරටදී උපන් තැනැත්තෙකු පැවිදි වී මෙරටදී විනය උගන්නා තාක් බුදු දහම මෙරට නොපිහිටන බව' (වජිරඥාන, 2002, පි.4) ප්‍රකාශ කරන මිහිඳු මහරහතන් වහන්සේ අරිට්ඨ ඇමති ප්‍රමුඛ ශ්‍රී ලාංකිකයන් පිරිසක් පැවිදි බිමට ඇතුලත්කර ගැනීමෙන් මහාවිහාරීය විධිමත් අධ්‍යාපනයේ ආරම්භය සනිටුහන් වේ. මිහිඳු හිමි වෙනුවෙන් කාලප්‍රාසාද පිරිවෙන, සුන්හාත පිරිවෙන, දීඝචංකමණ පිරිවෙන, ඵලග්ගපිරිවෙන, මරුගණ පිරිවෙන සහ ථෙරාපස්සය පිරිවෙන ආදී පිරිවෙන් දේවානම්පියතිස්ස රජු විසින් කරවූ අතර අමාත්‍යවරයෙකු වූ දීඝසන්දි විසින් කරවූ පිරිවෙන දික්සඳ සෙනෙවියා පිරිවෙන නම් විය. (මහාවංශය, 2007. පරි.15, ගාථා. 223-230) බුද්ධදාස රජු විසින් කරවූ මයුර පිරිවෙන, (මහාවංශය, 2007. පරි.37, ගාථා. 173) පියංගු පිරිවෙන, බුද්ධඝෝෂ හිමි වැඩ සිටි ග්‍රන්ථාකර පිරිවෙන, කීර්තිසේන ඇමති කරවූ පිරිවෙන, උත්තර නම් මන්ත්‍රීවරයා කරවූ පිරිවෙන ආදී වශයෙන් පිරිවෙන් ගණනාවක් මහාවිහාරය සතුවේ. මීට අමතරව මහාවිහාරය සතු වූ ප්‍රධානතම ආයතන ද්විත්වය වන්නේ ගලතුරුමූළ හෙවත් සේලන්තර මූලය සහ විල්ගම්මුල හෙවත් සරෝගාම මූලය ය. (රණසිංහ, 2007) මීට අමතරව පෙර සඳහන් කළ පංචමහා ආවාසයන් ද මහාවිහාරය යටතේ ක්‍රියාත්මක වී ඇත. අභයගිරිය වෙත අවධානය යොමු කිරීමේ දී උත්තරාල්හ මූලායතනය (උතුරු මූල), කප්පුර මූලායතනය (කාපාරාමූල) වාහදීපක මූලායතනය (වහදූමූල) සහ මහා නෙත්තපාසාද මූලායතනය (මහනෙත්පාමූල) යන මූලායතන හතරක් පැවති බව හඳුනාගත හැකිය. (කුලතුංග, 2014) සීගිරි ගීයකට අනුව උතුරළු පිරිවෙන හෙවත් උත්තර මූලය කරවා ඇත්තේ රියන්දල් නමැත්තෙකි. (Paranavitana, 1956) මෙම රියන්දල් යනු හත්ථදාඨ රජු බව පූජාවලිය තහවුරු කරයි. පසු කලෙක මානවම්ම රජු විසින් තම සහෝදර මාන කුමරුගේ පැවිද්දත් සමග උත්තර මූලය සහෝදර භික්ෂුවට පූජා කර ඇති අතර එම භික්ෂුව උත්තර මූලයේ නායකත්වය හොබවමින් ශිෂ්‍ය භික්ෂූන් හයසියයක් සමග වාසය කළ බව මහාවංශය සඳහන් කරයි. නාම්බකඩවැව ටැම් ලිපියේ සහ පඬුවස්නුවරින් හමුවන සෙල්ලිපියක ද මෙම උත්තරාල්හ මූලය පිළිබඳ සඳහන් වේ. (කුලතුංග, 2014) මහනෙත්පාමුල හෙවත් මහානෙත්ත පාසාද මූලායතනය පස්වැනි අග්ගබෝධි රජු විසින් (මහාවංශය, පරි. 46-48, ගාථා. 1) පිහිටවූයේ යැයි සැලකේ. වාහදීපක හෙවත් වහදූ මූලය මානවම්ම රජු විසින් කරවූ බව පූජාවලිය (1953) සඳහන් කරන අතර සයවැනි අග්ගබෝධි රජු ඊට ප්‍රාසාදයක් කරවා ඇති බවත් කියැවේ. (මහාවංශය, පරි. 46, ගාථා. 65) කපාරාමූලයට අයත් කුඩා කපාරා පිරිවෙණ පස්වැනි කාශ්‍යප රජු විසින් ද, මහා කපාරා පිරිවෙණ දෙවැනි දාඨෝපතිස්ස රජු විසින් ද කරවා ඇති අතර එම ආයතන ද්විත්වය ඒකාබද්ධ කොට මූලායතනයක් ලෙස පිහිටුවා ඇත්තේ පළමුවන සේන රාජ්‍ය සමයේ දී ය. (මහින්ද හිමි, 2018) උදාමහයාගේ පුලියන්කුලම සෙල්ලිපිය, උදාමහයාගේ ඉතෙන (සිංහල ගෙදර) සෙල්ලිපිය සහ ඔතියමලේ සෙල්ලිපිය යන සෙල්ලිපිවල ද කපාරාමූලය පිළිබඳ සඳහන්කර ඇත. (කුලතුංග, 2014) දක්ඛිණ මූලය සහ සේනාපති මූලය අප සාකච්ඡාවට බඳුන් වන අනෙක් සංඝාරාමය වන ජේතවන විහාරයට සම්බන්ධ මූලායතන ද්විත්වය විය. වළගම්බා රාජ්‍ය සමයේ උත්තිය නම් ඇමතිවරයා විසින් කරවූ දක්ඛිණ මූලය සාගලිය නිකායිකයින්ගේ මධ්‍යස්ථානය වශයෙන් ජේතවනාරාමයේ මූලායතනයක් බවට පත්ව ඇති අතර එය දක්ඛිණගිරිය යනුවෙන් ද පුරාතන මූලාශ්‍රයන්හී සඳහන් වේ. (මහින්ද හිමි, 2018) පළමුවැනි මුගලන් රජු ජේතවනයෙහි රජිණ නම් භික්ෂුණී ආරාමය කරවා ඇති අතර සීගිරි දළ්හ විහාරය, දරිදායා කොඩ්ඩඤ්ඤ විහාරය වැනි විහාරයන් ද කරවා ඇත. (මහාවංශය, 2007, පරි:39, ගාථා: 40-43) සිව්වැනි කාශ්‍යප රජුගේ සෙන්පති ළංගසේන විසින් ජේතවනයේ කසුබ් සෙන් ආරාමය කරවීය. (මහාවංශය, 2007, පරි:52, ගාථා. 17) චමුපති මූලය, සේනාපති මූලය නැතහොත් සෙනෙවිරද් මූලය තෙවැනි අග්ගබෝධි රජුගේ සෙන්පතියෙකු වූ පොත්ථසාත විසින් කරවා ඇති අතර මහාවංශයෙහි එය සිරිසඟබෝ පිරිවෙණ ලෙස දක්වා තිබේ. (මහාවංශය, 2007, පරි. 44, ගාථා 22) ජේතවනයේ බෝධිසරයෙහි "දොරටු පැන් මඩිය" සම්බන්ධ නීතිරීති පනවා ඇති පුවරු ලිපියෙහි මෙම සෙනවිරද් මූලය වෙත පැනවූ නීති රීති සඳහන් වේ. සිව්වැනි මිහිඳු රජුගේ සෙන්පතියන් සිව්දෙනෙකු විසින් ද ජේතවනාරාමය උදෙසා පිරිවෙන් හතරක් (මහාවංශය, 2007, පරි. 54, ගාථා. 51) පූජා කර ඇති අතර දොරටුපැන් මණ්ඩප පුවරු ලිපියෙහි රත්නමා පිරිවෙන පිළිබඳව සඳහන් වේ.

මෙලෙසින් මහාවිහාරය, අභයගිරිය සහ ජේතවනාරාමය යන සංඝාරාම ත්‍රිත්වයෙහිම මූලායතන පිහිටුවා තිබූ බව පැහැදිලි වේ. කෝට්ටේ අවධිය වනවිට අෂ්ට මූලායතන වශයෙන් ප්‍රකට වූ මෙම මූලායතන තම මූල බීජය

වූ අනුරාධපුරයේ විහාරස්ථාන පිරිහී ගිය ද සියවස් ගණනාවක් මුළුල්ලේ අධ්‍යාපනික ආයතන වශයෙන් ක්‍රියාත්මක වී තිබේ. මෙකී මූලායතන වෙත අවධානය යොමු කිරීමේ දී මූලායතන සංකල්පය ව්‍යූහාත්මකව විශ්වවිද්‍යාලයන්හී 'පීඨ' වලට සමාන වන බව හඳුනාගත හැකි ය. සෑම මූලායතනයක්ම උසස් අධ්‍යාපන ඒකකයක් වශයෙන් ක්‍රියාත්මක වී ඇති අතර නූතනයේ මෙන් විෂයානුබද්ධව හෝ නිකාය මූලිකව පීඨ සහ දෙපාර්තමේන්තු වශයෙන් බෙදා පවතින්නට ඇත. මේ බව සනාථ කළ හැකි එක් කරුණක් නම් මෙම පීඨ පාලනයට පීඨාධිපතිවරුන් හෙවත් මහානායක භික්ෂූන් පත්කර පැවතීමයි. අභයගිරි උත්තර මූලයේ නායකත්වයට මානවම්ම රජුගේ සහෝදර භික්ෂුව පත්කර ඇති අතර (මහාවංශය, 2007, පරි. 57, ගාථා. 18-27) වුත්තමාලාව රචනා කරන ලද ගතාරාභිධාන මහාසාමි විසින් ජේතවන සේලන්තර මූලයේ අධිපති භික්ෂුව වර්ණනයට නගා තිබේ. (මහින්ද හිමි, 2018) මේ අනුව සෑම මූලායතනයක් ම අධිපති භික්ෂුව යටතේ පාලනය වී ඇත. පීඨ වලට අමතරව මෙම විහාර හා සමගාමීව ඉදි කළේ යැයි පෙර සඳහන්කළ පිරිවෙන් සමූහය ඒ ඒ විහාරයන්ට අයත් මණ්ඩප හෝ අනුබද්ධ අධ්‍යාපන ආයතන වශයෙන් ක්‍රියාත්මක වන්නට ඇත. මේ අනුව පීඨ, මණ්ඩප හෝ අනුබද්ධ ආයතන වශයෙන් බෙදා පවතින විශ්වවිද්‍යාලයීය ව්‍යූහය පුරාතන අනුරාධපුර සංඝාරාම ආශ්‍රිතව ද ක්‍රියාත්මක වී ඇති බව තහවුරු කළ හැකිය. ඔවුහූ මූලායතන කේන්ද්‍රීය ගුරුකුල වශයෙන් කෝට්ටේ අවධිය දක්වාම ස්වාධීනව ශාස්ත්‍රීය කාර්යයන්හී නිරත වී තිබේ.

විශ්වවිද්‍යාලය වූ කලී සාමාන්‍ය සමාජයට සාපේක්ෂව ශාස්ත්‍රීය වශයෙන් සංවර්ධනය වූ ආචාර්යවරුන් සහ විද්‍යාර්ථීන්ගෙන් යුතු ස්ථානයකි. එහෙයින්ම විශ්වවිද්‍යාලයක ශිෂ්‍ය භාවය ලබා ගැනීම වත්මනෙහි පවා ඉතාමත් තරගකාරී මට්ටමක පවතී. අනුරාධපුර අවධියේ ද සංඝාරාම ආශ්‍රිත මෙම අධ්‍යාපන මධ්‍යස්ථානයක ශිෂ්‍යයෙකු වශයෙන් ඇතුළත් වීම දුෂ්කර අභියෝගයක් විය. ඒ සඳහා වත්මනෙහි මෙන්ම ප්‍රවේශ විභාගයක් ක්‍රියාත්මක වී ඇත. ඉන්දියාවේ රේවත  නම් ආචාර්යවරයාගේ ශිෂ්‍යයෙකු වූ බුද්ධඝෝෂ භික්ෂුව මහාවිහාරය වෙත පැමිණි අවස්ථාවේ දී උන්වහන්සේව මයුර පිරිවෙණෙහි වාසය කළ සංඝපාල භික්ෂුව විසින් ප්‍රවේශ පරීක්ෂණයකට යොමුකර තිබේ. (කුලතුංග, 2018) එනම් '"අන්තෝ ජටා බහි ජටා - ජටාය ජටිතා පජා - තංතං ගෝතම පූජේමි - කො ඉමං විජටයේ ජටං" යන ගාථා පාඨය විස්තර කරමින් පර්යේෂණ නිබන්ධයක් ඉදිරිපත් කිරීමයි. ඒ අනුව බුද්ධඝෝෂ හිමියන් විසින් ත්‍රිපිටක ධර්මය හකුළුවා  විසුද්ධි මග්ගය රචනා කර තම පර්යේෂණ නිබන්ධනය ලෙස ඉදිරිපත්කර තිබේ. එම පරීක්ෂණයෙන් සමත් වූ පසු බුද්ධඝෝෂ හිමියන්ට ග්‍රන්ථාකර පිරිවෙණෙහි වූ කෘති පරිශීලනය කරමින් පාළියට පරිවර්තනය කිරීමට අවසර ලබා දී තිබේ. මෙම ඇතුළත්වීමේ පරීක්ෂණයෙන් අසමත් වූ බුද්ධදත්ත හිමියන්ට හෙළටුවා අධ්‍යයනය කිරීමෙන් පමණක් සෑහීමකට පත් වීමට සිදු විය. පාහියං භික්ෂුව අභයගිරියට පැමිණ එහි පුස්තකාලයෙන් තමාට අවශ්‍ය පොත්පත් ලබා ගැනුමට අවසර පතා වසර දෙකකට ආසන්න කාලයක් මගබලා සිට ඇත.  ඒ වනවිටත් පුස්තකාලය භාර ප්‍රධාන භික්ෂුව දඹදිව වන්දනාවේ ගොස් සිට ඇති අතර පසුව ග්‍රන්ථ නාම පමණක් බලා චීනයේ නොමැති පොත් තුනක් තෝරාගෙන යාමට පාහියං භික්ෂුවට සිදු විය. (කුලතුංග, 2014)  එයින් තහවුරු වන්නේ මෙම විශ්වවිද්‍යාල ප්‍රවේශ පර්යේෂණය තරමක් සංකීර්ණ විභාගයක් වු බවත්, එමගින් ආයතනයෙහි අධ්‍යාපන මට්ටම උසස් තලයක විධිමත්ව රඳා පවත්වා ගැනීමට හැකියාව ලැබුණු බවත් ය.

විශ්වවිද්‍යාලය විවිධ අංශයන් නියෝජනය කරන දැනුම මධ්‍යස්ථානයකි. නූතන විශ්වවිද්‍යාලයන්හී කාලානුරූපී වූ විෂයන් ගණනාවක් ඉගැන්වේ. සෙසු උසස් අධ්‍යාපන ආයතනවලින් විශ්වවිද්‍යාලය විශේෂ වන්නේ එහි උගන්වනු ලබන විෂයමාලාවේ ගුණාත්මක භාවය හේතුවෙනි. මහාවිහාරය තුළ ථෙරවාදී අදහස් පමණක් උගන්වන විට අභයගිරියේ සාර්වස්ථිවාදය, වාජිරියවාදය, තන්ත්‍රයානය වැනි මහායානික මතවාදයන් ද උගන්වා ඇත. පොදුවේ මෙම සියළුම අධ්‍යාපන ආයතනයකම පාහේ ඉතිහාසය, තර්ක ශාස්ත්‍රය, යෝග ශාස්ත්‍රය, වෛද්‍ය විද්‍යාව, නක්ෂත්‍රය, නීතිය, ගෘහ නිර්මාණ ශිල්පය, චිත්‍ර, කැටයම් සහ මූර්ති මෙන්ම ද්‍රවිඩ හා ප්‍රාකෘත භාෂාවන් උගන්වා තිබේ. (මහින්ද හිමි, 2018) මහාවිහාරයෙහි ව්‍යාකරණ, සාහිත්‍ය, ගණිතය, වෛද්‍ය ශාස්ත්‍රය සහ නක්ෂත්‍රය වැනි විෂයන් ඉගැන්වූ බව සාරාර්ථදීපනිය තහවුරු කරයි. (සාරානන්ද හිමි, 2014) ශාස්ත්‍රිය විෂයන් පමණක් නොව ලෝහ කර්මාන්තය, ගෘහ නිර්මාණ ශිල්පය, වාරි තාක්ෂණය, විදුරු නිර්මාණය ආදී විෂයන් ද මෙමඟින් හැදෑරීමට හැකි විය. අභයගිරි භූමියෙන් රත්‍රන් කර්මාන්තශාලාවක සහ වර්ණ නිෂ්පාදන ස්ථානයක සාක්ෂ්‍ය ලැබී ඇත.

සමන්තපාසාදිකාවට අනුව මහාවිහාරීය ශිෂ්‍ය භික්ෂුවක් තම අධ්‍යාපනික ජීවිතයේ කඩඉම් තුනක් පසුකළ යුතු වේ. එනම්, නිස්සයමුච්චනක, පරිසුපට්ඨාපක සහ භික්බුනෝවාදක නම් වූ අවස්ථා තුනයි. නිස්සයමුච්චනක අවස්ථාවට පත්විය හැක්කේ උපසම්පදාවෙන් පස් වසරක් ඉක්මවූ භික්ෂූන්ට ය. එමෙන්ම එම භික්ෂූන් පිරිත් බණවර හතරක්වත් දතයුතුය. භික්බු භික්බුණී පාතිමොක්ක දෙකක්වත් කටපාඩම් විය යුතු ය. අන්ධකවින්ද සූත්‍රය, මහා රාහුලෝවාද සූත්‍රය, අම්බට්ඨ සූත්‍රය වැනි සූත්‍ර ද, අනුමෝදනාවන් තුනක් ද කටපාඩමින් උගත යුතු වන්නේ ගිහියන් සමඟ නොපැකිළව සමීපව සබඳතා පැවැත්විය යුතු හෙයිනි. එසේම උපෝසථකර්මය, පාවර්ණය වැනි විනය කර්ම හා කමටහන් ද දැන සිටිය යුතු වේ. (රාහුල හිමි, 1955) උපසම්පදාවෙන් වසර දහයක් ඉක්මවූ පසු පරිසුපට්ඨාපක තත්ත්වයට ළඟාවෙයි. මෙහිදී ද විනය විභංග දෙකක්, විනය කර්ම, ඛන්ධක

වත්ත ආදිය උගත යුතු ය. මජ්ඣිම භාණක තෙර කෙනෙකුන් නම් මජ්ඣිම නිකායේ මූල පණ්ණාසකය ද, සංයුත්තභාණක තෙර කෙනෙකුන් නම් සංයුත්ත නිකායේ මහාවග්ගයට අයත් මුල් කාණ්ඩ තුන ද, අංගුත්තර භාණක භික්ෂුවක නම් අංගුත්තර නිකායේ පළමුවෙනි කොටස, දෙවැනි කොටස හෝ තික නිපාතය දක්වා ද උගත යුතු අතර ජාතක භාණක භික්ෂුවක නම් සමස්ත ජාතක පාළිය සහ එහි අටුවාව කටපාඩම් විය යුතු ය. (රාහුල හිමි, 1955) භික්ඛුණෝවාදක භික්ෂුවක ත්‍රිපිටකය සහ අට්ඨකතා පිළිබඳ මනා දැනුමකින් යුතු වීම අනිවාර්ය ය. සිව් නිකායෙන් එක් අටුවාවක විශේෂඥ දැනුමක් ද, අභිධර්ම ග්‍රන්ථ හතරක අට්ඨකතා ද, සමස්ත විනය පිටකය පිළිබඳව ද අවබෝධයක් පැවතිය යුතු ය. (රාහුල හිමි, 1955) මෙ සාමාන්‍ය රාජ්‍ය විශ්වවිද්‍යාලයක ශාස්ත්‍රවේදී, ශාස්ත්‍රපති, ආචාර්ය හෝ මහාචාර්ය තත්ත්වයන්ට පත් වීම හා සමාන ය. තේපිටකධරා, ආභිධම්මිකා, සුත්තන්තිකා, මාතිකාධාරා සහ විනය ධාරා (මහින්ද හිමි, 2018) ලෙස ත්‍රිපිටකයේ එක් එක් කොටස්වලට විශේෂඥයින් ද සිට ඇත. අංගුත්තරභාණක, ජාතකභාණක, දීඝභාණක, ධම්මපදභාණක, සංයුත්තභාණක, මජ්ඣිමභාණක සහ විභංගභාණක ආදී ත්‍රිපිටකයේ එක් කොටසක් හෝ කිහිපයක් කටපාඩමින් ධාරණය කර තම සිසුන්ට ද ඒවා කටපාඩම් කරවීමේ යෙදුණු භික්ෂූන් ද මෙහිලා වැදගත් වේ.

පුරාතන සංඝාරාමයන්හී ඉගෙනුම්, ඉගැන්වීම් හා පර්යේෂණ ක්‍රමවේදය වෙත අවධානය යොමු කිරීමේ දී එය සුත (ශ්‍රවණය), ධත (ධාරණය), වාචා පාරමිතා (භාවිතයට ගැනීම), වාසානුපෙක්ඛනා (ප්‍රත්‍යාවේක්ෂණය කිරීම), දිට්ඨායාසුප්පටිවිද්‍යා (අවබෝධය ලබා ගැනීම) යන පියවර පහකින් යුක්ත වූ බව හඳුනාගත හැකිය. අධ්‍යයනය හෙවත් ඉගැන්වීම, ධාරණය හෙවත් උගත් දේ මතකයෙහි තැන්පත්කර ගැනීම, පරිචය හෙවත් අභ්‍යාසය සහ පරිපුච්ඡා හෙවත් විමංසනය යන අංගයන්ගෙන් පුරාණ අධ්‍යාපනය සමන්විත වූ බවයි. (වජිරඥාන හිමි, 2002) එමෙන්ම මහාවිහාරය තුළ දිනපතා දහවල් පිණ්ඩපාතයට පෙර එක් කාලච්ඡේදයක් ද, දහවල් දානයෙන් පසු දෙවැනි කාලච්ඡේදය ද, සවස ආගමික සිරිත්වලින් පසුව තෙවැනි කාලච්ඡේදය ද ක්‍රියාත්මක වී තිබේ. (රාහුල හිමි, 1955) සමන්තපාසාදිකාවට අනුව රාත්‍රී කාලයේ පහන් එළියෙන් අධ්‍යාපන කාර්යයන්හී නිරත වූ භික්ෂූණ් ද වැඩවාසය කර ඇත. (රාහුල හිමි, 1955)

ශාස්ත්‍රීය අධ්‍යාපනය හමාර කිරීමෙන් පසු වාගීශ්වර, කවිචක්‍රවර්ති, කවිරාජ, විද්‍යාපති, කවි කාල සර්වඥ, සරස්වතී, මහාපාත්‍ර සහ සූර්ය පන්ඩිත වැනි උපාධි නාමයන් ලබා දීමට ද මෙම විශ්වවිද්‍යාලයන් උත්සුක වී තිබේ. ඉන්දියාවේ සිට පැමිණ මෙරට අධ්‍යාපනය හැදෑරූ බුද්ධඝෝෂ හිමියන්ට මහාවිහාරවාසී සංඝපාල ඇතුළු නායක භික්ෂූණ් විසින් "මහාවිහාර වංසාලංකාර" යන උපාධි නාමය ප්‍රදානය කර ඇත. (ඇඳගම, 2015) මෙය වත්මන් විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය අවසානයේ ලත් ප්‍රතිඵල මත විද්‍යාර්ථීන් විසින් ලබාගන්නා වූ උපාධීන් හා සමානුපාත වේ.

විශ්වවිද්‍යාලයක හදවත බඳු පුස්තකාල අද මෙන්ම අතීතයේ දීත් අධ්‍යාපනික මධ්‍යස්ථානයේ දැනුම ගබඩාව බවට පත්ව තිබුණි. මහාවිහාරය සතුව දික්සඳසෙනෙවියා පිරිවෙනෙහි පැවති පුස්තකාලය (ඇඳගම, 2015) සහ ග්‍රන්ථාකර පිරිවෙණ (Ranaweera, 2013) යනුවෙන් පුස්තකාල දෙකකි. අභයගිරියේ උත්තර මූලය සහ කපාරා මූලයෙහි පුස්තකාල පැවති අතර පාහියං භික්ෂුව එම පුස්තකාලයකින් තමාට අවශ්‍ය පොත්පත් ලබා ගැනුමට අවසර පතා වසර දෙකකට ආසන්න කාලයක් මගබලා සිටි බව වාර්තා වේ. සිලාකාල රාජ්‍ය සමයේ 'ධර්මධාතුව' නම් වූ ග්‍රන්ථය තැන්පත් කිරීම පිණිස ජේතවන විහාර භූමිය තුළ ධර්ම ශාලාවක් කරවා ඇති අතර දැනට එහි නටබුන් සංරක්ෂණය කර තිබේ. මේ සියල්ල තුළින්ම විශ්වවිද්‍යාල පුස්තකාල පද්ධතියක් සිහියට නැංවේ. මෙම පුස්තකාල සඳහා දැඩි ආරක්ෂාවක් යොදවා එම දැනුම සම්භාරය අවභාවිතය වළක්වා තිබූ බව පැහැදිලි වේ. පාහියං භික්ෂුව ග්‍රන්ථ නාම බලා තමාට අවශ්‍ය පොත තෝරා ගත්තේ නම් ඒ වනවිටත් පුස්තකාලය මනාව සංවිධානය කරමින් පාඨකයාගේ පහසුව තකා ග්‍රන්ථ වර්ගීකරණය කර තිබූ බව තහවුරු වේ. එම ග්‍රන්ථයන් අනෙකුත් බෞද්ධ රටවල් සමඟ හුවමාරු කරගෙන ඇති අතර මෙමගින් තහවුරු වන්නේ නූතන විශ්වවිද්‍යාලයීය පුස්තකාලයක පවත්නා ආකෘතික ලක්ෂණ වලින් යුතු විශාල පොත් ප්‍රමාණයක් සහිත පුස්තකාල පුරාතන සංඝාරාම අධ්‍යාපන ආයතනයන් සතුව ද පැවති බවය.

විශ්වවිද්‍යාලයක ජීවනාලිය වන්නේ එහි ආචාර්යවරුන් සහ ශිෂ්‍ය විද්‍යාර්ථීන් ය. අප සාකච්ඡාවට බඳුන්වන මහාවිහාරය, අභයගිරිය සහ ජේතවනාරාම විහාරයන් තුළින් ප්‍රකට විද්වතුන් ගණනාවක් දේශයටත්, ජාත්‍යන්තරයටත් මුදාහැර තිබේ. මහාවිහාරයෙහි ප්‍රකට විද්‍යාර්ථියෙකු ලෙස විදේශීය භික්ෂුවක වන අටුවාචාරී බුද්ධඝෝෂ හිමියන් පෙන්වාදිය හැකි ය. ඊට අමතරව කාරලියගිරිවාසී නාග හිමි, තුලාධර පබ්බතවාසී ධම්මරක්ඛිත හිමි, මහා ගතිම්බ අභය හිමි, දීඝභාණක අභය හිමි, ත්‍රිපිටක චූලාභය හිමි යන භාණක තෙරවරුන් පෙන්වාදිය හැකිය. (රාහුල හිමි, 1955) ඉට්ඨිය, උත්තිය, සම්භල, භද්දසාල, අරිට්ඨ, තිස්සදන්ත, කායසුමන, දීඝසුමන, මහානාග, බුද්ධරක්ඛිත, තිස්සදේවසුමන, මහාසිව, උපාලි, පුපනාග, චූලාභය, තිස්ස, අභයතිස්ස, චූලදේව, සිව, චුල්ලසුධම්ම, ත්‍රිපිටක ධම්මරක්ත, මහා සුධම්ම, ත්‍රිපිටක චුල්ලසුමන සහ ධම්මිකගෝධ යනාදී මහාවිහාරීය භික්ෂූන් පිළිබඳව මහාවංශය සහ දීපවංශය තුළ සඳහන් වේ. බුද්ධඝෝෂ හිමි, ධම්මපාල හිමි, විශාක හිමි, ජප්පට මිහි, පීතිමල්ල හිමි සහ බුද්ධදත්ත හිමි වැනි විදේශිය ශිෂ්‍යයින් ද විය. අභයගිරිය වෙත අවධානය

යොමු කිරීමේ දී, කවිචක්‍රවර්ති ආනන්ද හිමි, ආචාර්ය ශූරපාද වැනි විද්‍යාර්ථීන් ගණනාවක් හඳුනාගත හැකි අතර පාහියං භික්ෂුව වැනි විදේශීය භික්ෂූන් ද මෙහි අධ්‍යාපනය ලබා ඇත. කුරුන්දවුල්ලක විහාරවාසී දාඨාවේධක හිමි, ශාරිපුත්‍ර හිමි, ගතාරාභිධාන හිමි වැනි විද්වත් භික්ෂූන් ජේතවනයට අයත් වූහ. නූතන විශ්වවිද්‍යාල මෙන්ම මෙම පුරාණ විද්‍යායතනයන් ද ඉන්දියාව, චීනය, ජාවා, කාම්බෝජය ආදී රාජ්‍යයන් සමඟ සබඳතා පැවැත්වූ අතර ඉන් බහුතරයක් බැඳී ඇත්තේ අසල්වැසි ඉන්දියාව සමඟය. මහායානයට විවෘත වූ අභයගිරිය වෙත රත්නාකර ශාන්ති හිමි මහායාන ග්‍රන්ථ රැගෙන පැමිණි අතර ක්‍රි.ව. 740 දී වජ්‍රබෝධි නම් භික්ෂුව සහ එතුමන්ගේ ශිෂ්‍ය අමෝඝවජ්‍ර මෙරටට පැමිණ තිබේ. (කුලතුංග, 2014) දේශීය භික්ෂූන් සිය පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා ඉන්දියාවේ නාලන්දා, වික්‍රමශීලා වැනි විශ්වවිද්‍යාලයන්ට ඇතුළත් වී තිබේ. ජාවා හී රතු බක සානුවෙන් හමු වූ සෙල්ලිපියක "සිංහල භික්ෂූණ්ගේ අභයගිරි විහාරය මෙය වේ. (අභයගිරි විහාරඃ කාරිතඃ සිංහලානාම්)" (රැළපනාව, 18) යනුවෙන් සඳහන් වන අතර එයින් තහවුරු වන්නේ විදේශයන්හී ද දේශීය විශ්වවිද්‍යාලයන්ට අනුබද්ධ ආයතන පැවතුණු බවයි.

මෙම විද්‍යායතනයන් හී නූතන විශ්වවිද්‍යාලවල මෙන්ම විවිධ පර්යේෂණයන්, කෘති, පත්‍රිකා ආදිය එළිදක්වා තිබේ. උදාහරණ වශයෙන් දීපවංශය, මහාවංශය, වංසත්ථප්පකාසිනි, මහා චේතිය වංසට්ඨකතාව, උත්තරවිහාරට්ඨකතා, සීහල නමස්කාර වර්ණනා, මහා බෝධිවංශ කතා, මුල් එළු බෝධිවංශය (ඇඳගම, 2015) ආදිය සාහිත්‍යයට දායාද වන්නේ මහාවිහාරයෙනි. බුද්ධඝෝෂ හිමියන්ගේ සුමංගල විලාසිනිය, ප්‍රපඤ්චසූදනී, සාරත්ථප්පකාසිනී, මනෝරථපූරණී, සමන්තපාසාදිකාව සහ කංඛාවිතරණී ආදී වූ මාලාවම ඊට මනා උදාහරණයක් වේ. (කුලතුංග, 2018) පූජාවලිය, ලෝවැඩසඟරාව, කව්ලකුණු මිණිමල, බුදුගුණ අලංකාරය, දහම්ගැට මාලාව, අනුරුද්ධ ශතකය, නාමරූප පරිච්ඡේදය, අභිධම්මත්ථ සංගහ, පරමත්ථ විනිච්ඡය ආදී කෘති ගණනාවක් කෝට්ටේ අවධිය දක්වාම බෞද්ධ භික්ෂූන් යටතේ පැවති ආකාරය අභයගිරියෙන් හඳුනාගත හැකිය. ජේතවනාරාමය ඔස්සේ සමන්ත පාසාදිකා විනයට්ඨකතාව, සාරාර්ථදීපනී ටීකාව, මනෝරථ පූරණී ටීකාව සහ විනය සංග්‍රහය වැනි කෘති බිහි වී තිබේ.

මීට අමතරව මෙම විද්‍යායතනයන්හී ක්ෂේත්‍ර අධ්‍යයනයේ නිරත වනවිට භික්ෂූණ් උදෙසා විහාරය තුළ කරවූ දාන ශාලාවන් තුළින් එම ශිෂ්‍ය විද්‍යාර්ථීන් උදෙසා අවශ්‍ය ආහාර සම්පාදනයත්, පොකුණු පද්ධතිය සහ කැසිකිළි-වැසිකිළි තුළින් සනීපාරක්ෂක පහසුකම් සැලසීමත් හඳුනාගත හැකි වේ. රත්‍රන් නිර්මාණයට, වීදුරු ආලේපයට ආදිය ට අවශ්‍ය විද්‍යාගාර පහසුකම් ද සළසා තිබී ඇත. භික්ෂූන්ගේ ශරීර සුවතාවය උදෙසා තැනින් තැන ජන්ථාඝර සහ එක් එක් විශ්වවිද්‍යාලයට අනුබද්ධ රෝහලක් බැගින් ද පිහිටුවා තිබේ. අභයගිරියේ දානශාලාවේ ඇති බත් ඔරුව පාත්‍ර 5800කින් පිරවිය හැකි බව රෝලන්ඩ් සිල්වා සූරීන් විසින් තහවුරු කර තිබේ. එමෙන්ම පාහියං භික්ෂුව ද අභයගිරියේ භික්ෂූණ් පන්දහසක් ද, මහාවිහාරයේ තුන්දහසක් ද වාසය කළ බව තම වාර්තාවේ සටහන් කර ඇත. මෙම ආරාමයන් පුරා ඇති කුඩා කුටි සහ පංචාවාසයන් නේවාසිකාගාර වශයෙන් ක්‍රියාත්මක වී ඇත. මේවායෙහි ඇති ප්‍රමාණාත්මක බව සහ විශාලත්වය අනුව ඉතා විශාල භික්ෂූණ් පිරිසකට වාසය කිරීමට හැකි වූ බව තහවුරු වේ.

**නිගමනය**

නූතන විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ එන *Academice Freedom* සංකල්පය ක්‍රියාත්මක වූ පුරාණ අධ්‍යාපන ආයතනයන් වශයෙන් මහාවිහාරය, අභයගිරිය සහ ජේතවනාරාමය ප්‍රථමයෙන්ම අධ්‍යයනය කළ අතර ඒවා ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රියාවලිය මෙන්ම පර්යේෂණ පහසුකම් සැපයූ විද්‍යායතනයන් ද විය. සමස්ත විශ්වවිද්‍යාලය පීඨ වශයෙන් බෙදා අධ්‍යාපන ක්‍රියාවලිය ගෙනගිය මෙහි සාහිත්‍ය, කලාව, කාව්‍ය, භාෂා ශාස්ත්‍ර, ඉතිහාසය, දර්ශනවාදය වැනි ශාස්ත්‍රීය විෂයන් මෙන්ම වෛද්‍ය ශාස්ත්‍රය, කාර්මික හා තාක්ෂණික විෂයන් මගින් ප්‍රායෝගික විෂයන් ද හැදෑරීමට අවස්ථාව සළසා ඇත. නූතන විශ්වවිද්‍යාලයක් පරිද්දෙන්ම දූනුමින් සන්නද්ධ පුස්තකාල නඩත්තු කරමින්, විද්‍යාගාර පහසුකම් සළසමින්, සිසුන්ගේ නේවාසිකාගාර සහ ආහාර අවශ්‍යතා පූරණය කරමින් ක්‍රියාත්මක වූ විධිමත් පරිපාලනමය ක්‍රියාවලියක් ඔස්සේ පාලනය කර ඇත. දේශීය සාහිත්‍යයට ඉතා වැදගත් කෘති රාශියක් මෙන්ම, වටිනා, උගතුන් බිහි කළ මෙම සංඝාරාමයන් ජාත්‍යන්තර වශයෙන් ද ප්‍රකට වී ඇත. ඒ අනුව අනුරාධපුර අවධියට අයත් මහාවිහාරය, අභයගිරිය සහ ජේතවනාරාමය කේන්ද්‍රියව පැතිරුණු සංඝාරාම අධ්‍යාපනය ශ්‍රී ලාංකේය නූතන විශ්වවිද්‍යාලය සංකල්පයට ඉතාමත් සමානුපාත වන බව තහවුරු කළ හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


අමරමෝලි හිමි, වේරගොඩ. (1953). *පූජාවලිය*, රත්නාකර පොත් වෙළඳහල

කුමාර එම්. ඒ. ප්‍රසාද්. අනුරපුර ජේතවනයේ බෞද්ධ ගරාදිවැට පුවරු ලිපියෙන් හෙළිවන පුරාණ දොරටු පැන් මණ්ඩපයක පරිපාලනය.

කුලතුංග , ටී. ජී. (2018), *අනුරාධපුර මහා විහාරය.* සරසවි ප්‍රකාශකයෝ

කුලතුංග , ටී. ජී. (2014), *පුරාණ අභයගිරි විහාරය.* මධ්‍යම සංස්කෘතික අරමුදල

ද සොයිසා, ඒ. පී. (2014). *දීඝනිකාය-3.* ඇස් ගොඩගේ සහ සහෝදරයෝ

මහින්ද හිමි, උණුවතුරබුබුලේ (2018). *ලංකා බෞද්ධ සංස්කෘතිය.* ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ

ඇඳගම, මාලනී, (2015). පූජ්‍ය වැලිවිටියේ සෝරත හිමි අනුස්මරණ උත්සවයේ දී කළ දේශනය ඇසුරින්. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

රණසිංහ, ආර්.එච්.අයි.එස්. (2005). අනුරාධපුර යුගයේ පැවති අධ්‍යාපන සම්ප්‍රදාය පිළිබඳව සෙල්ලිපි මගින් අනාවරණය වන තොරතුරු පිළිබඳ විමසීමක්. *Essays in Archaeology in Honor prof; H.T.Basnayake.* Godage International Publishers

රණසිංහ, ආර්.එච්.අයි.එස්. (2007). බෞද්ධ අධ්‍යාපන මධ්‍යස්ථානයක් වශයෙන් ශ්‍රී ලංකාවේ මූලායතනයන් හී වැදගත්කම -13 වැනි සියවස දක්වා, *සාරදා.* කැළණිය විශ්වවිද්‍යාලය.

රාහුල හිමි, වල්පොල (1955). *ලක්දිව බුදු සමයේ ඉතිහාසය.* එම්.ඩී.ගුණසේන සහ සමාගම

රුළපනාව, මහින්ද, *ඉන්දුනීසියාවේ ජාවා දූපතේ රතු බොකෝහී සිංහල භික්ෂූණිගේ අභයගිරි විහාරය*

වජිරඥාන හිමි.හොරණ, (2002). භික්ෂූණී වහන්සේගේ කාර්යභාරය හා සාසනික අධ්‍යාපනයේ විශිෂ්ට ලක්ෂණ, *Saddhamangala Karunarathna Felicitation Volume*, Archaeological Survey Department.

සාරානන්ද හිමි, දුනුකේඋල්ලේ. (2014). මහාවිහාරය හා ථෙරවාද බෞද්ධ සම්ප්‍රදාය. *මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය*, කැළණිය විශ්වවිද්‍යාලයඃ මානවශාස්ත්‍ර පීඨය

සුමංගල හිමි, හික්කඩුවේ සහ වෙනත්. (2007). *මහාවංශය.* බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

Paranavitana, S. (1956). *Sigiri Graffiti.vol.II,* Sri Lanka. Archaeological Survey Department

Ranaweera, R., & Ranasinghe, P. (2013). Libraries in Sri Lanka in the Ancient Anuradhapura Period: a Historical Account (250 B.C. – 1017 A.D.). *Journal of the University Librarians Association of Sri Lanka*, *17*(1), 66-75. DOI: https://doi.org/10.4038/jula.v17i1.6645